සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

11 | S | I, II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (11) සාමාන්‍ය විද්‍යාව - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සාමාන්‍ය විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට පිළිතුරු ලිවීමට ලබාදෙන පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න. එහි පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. පීඩනය මැනීමේ අන්තර්ජාතික සම්මත ඒකකය කුමක් ද?
   (1) $kg\ m^{-3}$ (2) $N\ m$ (3) $N\ m^{-2}$ (4) $m\ s^{-2}$

2. සෛලයක් තුළ ප්‍රෝටීන් සංශ්ලේෂණයට සෘජු සම්බන්ධතාවක් දක්වනුයේ කුමන ඉන්ද්‍රියිකාව ද?
   (1) මයිටොකොන්ඩ්‍රියම (2) රයිබොසෝමය
   (3) ගොල්ගිදේහය (4) රික්තකය

3. සාර්ව දායකයා ලෙස හැඳින්වෙන්නේ කුමන රුධිර ගණය සහිත පුද්ගලයා ද?
   (1) A (2) B (3) AB (4) O

4. ප්‍රභාසංශ්ලේෂණයේදී සිදු වන ශක්ති පරිණාමනය මින් කුමක් ද?
   (1) තාපජ ශක්තිය ⟶ රසායනික ශක්තිය
   (2) රසායනික ශක්තිය ⟶ තාපජ ශක්තිය
   (3) ආලෝක ශක්තිය ⟶ රසායනික ශක්තිය
   (4) ආලෝක ශක්තිය ⟶ තාපජ ශක්තිය

5. සෑම විට ම පෘථිවියේ උත්තර ධ්‍රැවය දෙසට යොමු ව පවතින තරුව කුමක් ද?
   (1) පෝලාරිස් (2) සීරියස් (3) කැනෝපස් (4) ඇල්ඩෙබරන්

6. සබ්මැරීනයක් තුළ සිටින අයකුට දිය මතුපිට ඇති දෑ නිරීක්ෂණයට භාවිත කළ හැක්කේ පහත කුමන උපකරණය ද?
   (1) පරීක්ෂය (2) අණ්වීක්ෂය (3) බහුරූපේක්ෂය (4) දූරේක්ෂය

7. පරීක්ෂණාත්මක සාක්ෂි පදනම් කරගනිමින් පදාර්ථයේ තැනුම් ඒකකය වන පරමාණුව පිළිබඳ ප්‍රථම වරට මතවාදයක් ඉදිරිපත් කළේ පහත කුමන විද්‍යාඥයා ද?
   (1) ඇරිස්ටෝටල් (2) මෙන්ඩලීෆ් (3) ඩෝල්ටන් (4) ඩෙමොක්‍රීටස්

8. ස්කන්ධාකන්දය ලෙස හැඳින්වෙන භූගත කඳක් දරන්නේ පහත කුමන ශාකය ද?
   (1) ඉඟුරු (2) අර්තාපල් (3) හබරල (4) මඤ්ඤොක්කා

9. කාබන්, කැල්සියම් සහ සෝඩියම් යන මූලද්‍රව්‍යවල රසායනික සංකේත පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
   (1) C, Ca සහ Sa (2) C, Ca සහ Na (3) K, C සහ Na (4) K, C සහ Sa

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

10. කාබන්වල සමස්ථානික පරමාණුවක් වන $^{14}_{6}C$ හි, 6 හා 14 සංඛ්‍යා මගින් පිළිවෙළින් දැක්වෙනුයේ,
   (1) ප්‍රෝටෝන සංඛ්‍යාව හා පරමාණුක ක්‍රමාංකය යි.
   (2) පරමාණුක ක්‍රමාංකය හා නියුට්‍රෝන සංඛ්‍යාව යි.
   (3) ස්කන්ධ ක්‍රමාංකය හා නියුට්‍රෝන සංඛ්‍යාව යි.
   (4) ප්‍රෝටෝන සංඛ්‍යාව හා ස්කන්ධ ක්‍රමාංකය යි.

11. රූපයේ දක්වා ඇති තරංගයේ විස්තාරය සහ තරංග ආයාමය පිළිවෙළින් කොපමණ වේ ද?
   (1) 5 cm සහ 2 m
   (2) 5 cm සහ 4 m
   (3) 10 cm සහ 2 m
   (4) 10 cm සහ 4 m




12. ප්‍රශ්වාසයේදී අන්තර්පර්ශුක පේශි සහ මහා ප්‍රාචීර පේශිය හැසිරෙන ආකාරය නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

| වරණය | අන්තර්පර්ශුක පේශි | මහා ප්‍රාචීර පේශිය |
|---|---|---|
| (1) | සංකෝචනය වේ. | සංකෝචනය වේ. |
| (2) | සංකෝචනය වේ. | ඉහිල් වේ. |
| (3) | ඉහිල් වේ. | සංකෝචනය වේ. |
| (4) | ඉහිල් වේ. | ඉහිල් වේ. |

13. දෛශික රාශි යුගලයක් දැක්වෙන්නේ පහත කුමන වරණයේ ද?
   (1) බලය සහ වේගය  (2) විස්ථාපනය සහ ප්‍රවේගය
   (3) දුර සහ බර  (4) කාලය සහ වේගය

14. චක්‍රය සහ අක්ෂ දණ්ඩ පිළිබඳ ව නිවැරදි වනුයේ පහත කුමන ප්‍රකාශය ද?
   (1) චක්‍රය එක් වටයක් කරකැවෙන විට අක්ෂ දණ්ඩ කිහිප වරක් කරකැවේ.
   (2) අක්ෂ දණ්ඩේ අරය, චක්‍රයේ අරයට වඩා වැඩි වූ විට පහසුවෙන් බර එසවිය හැකි ය.
   (3) ආයාසය අක්ෂ දණ්ඩට යොදනු ලබන අතර භාරය යෙදෙනුයේ චක්‍රයට ය.
   (4) වාහන සුක්කානම, චක්‍රය සහ අක්ෂ දණ්ඩ සරල යන්ත්‍ර වර්ගයට නිදසුනක් වේ.

15. ඕම් නියමයට අනුව උෂ්ණත්වය නියත නම් සන්නායකයක් හා සම්බන්ධ පහත කුමන අනුපාතය නියතයක් වේ ද?
   (1) $\frac{I}{R}$  (2) $\frac{R}{I}$  (3) $\frac{V}{I}$  (4) $\frac{R}{V}$

16. වාහන ගැටුමකදී සිදු වන හානියෙහි බරපතලබවට හේතු වන්නේ එම වාහනයේ,
   (1) ස්කන්ධය යි.  (2) බර යි.  (3) ප්‍රවේගය යි.  (4) ගම්‍යතාව යි.

17. මානව රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත පහත ප්‍රකාශ සලකා බලන්න.
   *A* - වඩාත් ම ඝනකම් බිත්ති සහිත කුටීරය වන්නේ වම් කෝෂිකාව ය.
   *B* - ශිරා තුළ කපාට පිහිටා ඇත්තේ හෘදය දෙසට විවෘත වන අන්දමට ය.
   *C* - ත්‍රිතුණ්ඩ කපාටය පිහිටා ඇත්තේ දකුණු කර්ණිකාව සහ දකුණු කෝෂිකාව අතර ය.
   ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
   (1) *A* සහ *B* පමණි.  (2) *A* සහ *C* පමණි.  (3) *B* සහ *C* පමණි.  (4) *A*, *B* සහ *C* සියල්ල ම ය.

18. ඉලෙක්ට්‍රෝන වින්‍යාසය 2, 8, 7 වන මූලද්‍රව්‍යය ආවර්තිතා වගුවේ කුමන ආවර්තයට අයත් ද?
   (1) 1  (2) 2  (3) 3  (4) 4

19. ආහාරයේ අඩංගු කාබෝහයිඩ්‍රේට ජීරණය වීම ආරම්භ වන්නේ,
   (1) මුඛයේදී ය.  (2) ආමාශයේදී ය.  (3) ග්‍රහණියේදී ය.  (4) ක්ෂුද්‍රාන්ත්‍රයේදී ය.

20. නුමුහුම් උස සහ නුමුහුම් මිටි ගෙවතු මෑ ශාක දෙකක් මුහුම් කළ විට $F_2$ පරම්පරාවේ පිළිවෙළින් උස සහ මිටි ශාක අතර අනුපාතය කුමක් ද?
   (1) 1 : 1  (2) 1 : 2  (3) 1 : 3  (4) 3 : 1

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

21. මිනිස් කනෙහි ඇති අර්ධචක්‍රාකාර නාලවලින් ඉටු වන කෘත්‍යය වන්නේ,
   (1) ශබ්ද තරංගවල තීව්‍රතාව වැඩි කිරීම ය.
   (2) දේහයේ සමතුලිතතාව පවත්වා ගැනීමට උපකාරී වීම ය.
   (3) ශබ්ද තරංග මැද කනේ සිට ඇතුළු කනට සම්ප්‍රේෂණය කිරීම ය.
   (4) ශ්‍රවණ අස්ථිකාවල කම්පන කර්ණශංඛයට ලබා දීම ය.

22. අධිවෘක්ක ග්‍රන්ථිවලින් ස්‍රාව වන හෝර්මෝනයක් වන්නේ මින් කුමක් ද?
   (1) ඇඩ්‍රිනලින්   (2) ඔක්සිටොසින්   (3) TSH   (4) FSH

23. චලිතය පිළිබඳ නිව්ටන්ගේ පළමුවැනි නියමයෙන් පැහැදිලි කළ හැක්කේ පහත කුමන ප්‍රකාශය ද?
   (1) මේසයක් මත නිශ්චල ව තබා ඇති ලී කුට්ටියක් මත බලයක් ක්‍රියාකරන්නේ නැත.
   (2) මේසයක් මත නිශ්චල ව තබා ඇති ලී කුට්ටියක් මත අසංතුලිත බලයක් ක්‍රියාකරන්නේ නැත.
   (3) වාහනයක සිදු වන ත්වරණය එය මත යොදන අසංතුලිත බලයට අනුලෝම ව සමානුපාතික ය.
   (4) ඕනෑ ම ක්‍රියාවකට විශාලත්වයෙන් සමාන වූ ද දිශාවෙන් ප්‍රතිවිරුද්ධ වූ ද ප්‍රතික්‍රියාවක් ඇත.

24. රසායනික සංයෝගයක් වන NaCl පිළිබඳ ව දී ඇති පහත ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) අයනික බන්ධන ඇත.   (2) තාපාංක හා ද්‍රවාංක ඉහළ අගයක් ගනී.
   (3) ජල ද්‍රාව්‍ය වේ.   (4) Na පරමාණු හා Cl පරමාණුවලින් සමන්විතය.

25. රතු-කොළ වර්ණාන්ධතාව පිළිබඳ ව අසත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
   (1) මෙයට හේතු වන්නේ ප්‍රමුඛ ජානයකි.
   (2) මෙම ආබාධයට වැඩිපුර ම ගොදුරු වන්නෝ පිරිමි ය.
   (3) මෙම ආබාධයට හේතු වන ජානය ඇත්තේ X වර්ණදේහය මත ය.
   (4) මෙහි වාහකයෝ වන්නෝ ස්ත්‍රීහු ය.

26. සම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
   *A* - දේහ උෂ්ණත්වය යාමනය සිදු කරයි.
   *B* - විටමින් A සංශ්ලේෂණය කරයි.
   *C* - බහිස්‍රාවී ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියා කරයි.
   ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
   (1) *A* සහ *B* පමණි.   (2) *A* සහ *C* පමණි.   (3) *B* සහ *C* පමණි.   (4) *A*, *B* සහ *C* සියල්ල ම ය.

27. රසායනික ප්‍රතික්‍රියාවක් නිරූපණය වන පොදු සමීකරණයක් පහත දැක්වේ.
   $$A + BC \longrightarrow AC + B$$
   එමගින් නිරූපණය වන්නේ කුමන වර්ගයේ ප්‍රතික්‍රියාවක් ද?
   (1) සංයෝජන   (2) වියෝජන   (3) ඒක විස්ථාපන   (4) ද්විත්ව විස්ථාපන

28. රූපයේ දැක්වෙන විද්‍යුත් පරිපථයේ *Q* සහ *R* බල්බ දෙක හරහා වන විභව අන්තරය මැනීමට වෝල්ට් මීටරයක් සම්බන්ධ කළ යුත්තේ,
   (1) *A* සහ *B* අතර සමාන්තරගත ව ය.
   (2) *A* සහ *B* අතර ශ්‍රේණිගත ව ය.
   (3) *C* සහ *D* අතර සමාන්තරගත ව ය.
   (4) *C* සහ *D* අතර ශ්‍රේණිගත ව ය.




29. විද්‍යුත් චුම්බක තරංග පිළිබඳ ව අසත්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) අන්වායාම තරංග වර්ගයකි.
   (2) රික්තයක් තුළින් වුව ද සම්ප්‍රේෂණය වේ.
   (3) විද්‍යුත් සහ චුම්බක ක්ෂේත්‍ර එකිනෙකට ලම්බ තලවල පිහිටයි.
   (4) රික්තයකදී නියත වේගයෙන් ගමන් කරයි.

30. මෙහි දැක්වෙන ඉටිපන්දම් දැල්ලක රූපසටහනෙහි අඳුරු කලාපය නිරූපණය වන්නේ කුමන අක්ෂරයෙන් ද?
   (1) *A*   (2) *B*   (3) *C*   (4) *D*




[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

31. තත් භාණ්ඩයක තාරතාව ඉහළ නැංවීම සඳහා එහි තතෙහි සිදු කළ හැකි වෙනස්කම් මොනවා ද?
    (1) දිග අඩු කිරීම හා ආතතිය වැඩි කිරීම
    (2) දිග අඩු කිරීම හා ආතතිය අඩු කිරීම
    (3) දිග වැඩි කිරීම හා ආතතිය වැඩි කිරීම
    (4) දිග වැඩි කිරීම හා ආතතිය අඩු කිරීම

32. කැල්සියම් කාබයිඩ්වලට ජලය එකතු කිරීමෙන් නිපදවන වායුව කුමක් ද?
    (1) මීතේන්
    (2) ඇසිටලීන්
    (3) කාබන් ඩයොක්සයිඩ්
    (4) කාබන් මොනොක්සයිඩ්

33. බීජ හටගන්නා අපුෂ්ප ශාකයකට නිදසුනක් වන්නේ මින් කුමක් ද?
    (1) පයිනස්
    (2) සෙලැජිනෙල්ලා
    (3) බේඳුරු
    (4) සැල්විනියා

34. අසම්පූර්ණ රූපාන්තරණයක් පෙන්වන සත්ත්වයෙක් වන්නේ,
    (1) සමනලයා ය.
    (2) මදුරුවා ය.
    (3) ගෙමැස්සා ය.
    (4) කැරපොත්තා ය.

35. මෙහි දැක්වෙන්නේ විද්‍යුත්-චුම්බක ප්‍රේරණය හා ආශ්‍රිත ක්‍රියාකාරකමකට අදාළ රූපසටහනකි.
    මෙහි ගැල්වනෝමීටරයෙහි දර්ශකය උත්ක්‍රමණය නොවන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේ දී ද?




    (1) චුම්බකය කම්බි දඟරය තුළට ඇතුළු කරන විට
    (2) චුම්බකය කම්බි දඟරය තුළින් ඉවතට අදින විට
    (3) කම්බි දඟරය චුම්බකය දෙසට චලනය කරන විට
    (4) චුම්බකය, කම්බි දඟරය තුළ තබා දෙක ම එකවර (එකට) චලනය කරන විට

36. රබර් පිළිබඳව දී ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.
    *A* - රබර් කිරිවල අයිසොප්‍රීන් අඩංගු වේ.
    *B* - රබර් කිරි කැටි ගැසීම සඳහා ඇමෝනියා යොදා ගැනේ.
    *C* - රබර් වල්කනයිස් කිරීමට සල්ෆර් භාවිත කෙරේ.
    ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වනුයේ,
    (1) *A* පමණි.
    (2) *B* පමණි.
    (3) *A* සහ *C* පමණි.
    (4) *B* සහ *C* පමණි.

37. ප්‍රතීක චාපයේ නිවැරදි අනුපිළිවෙළ වන්නේ පහත සඳහන් කුමක් ද?
    (1) ප්‍රතිග්‍රාහකය ⟶ සුෂුම්නාව ⟶ සංවේදක නියුරෝනය ⟶ චාලක නියුරෝනය ⟶ කාරකය
    (2) ප්‍රතිග්‍රාහකය ⟶ සංවේදක නියුරෝනය ⟶ චාලක නියුරෝනය ⟶ සුෂුම්නාව ⟶ කාරකය
    (3) ප්‍රතිග්‍රාහකය ⟶ සංවේදක නියුරෝනය ⟶ සුෂුම්නාව ⟶ චාලක නියුරෝනය ⟶ කාරකය
    (4) ප්‍රතිග්‍රාහකය ⟶ චාලක නියුරෝනය ⟶ සුෂුම්නාව ⟶ සංවේදක නියුරෝනය ⟶ කාරකය

38. තල දර්පණයක් ඉදිරියේ 2 m ක් දුරින් සිටි මිනිසෙක් (*a* අවස්ථාව) තවත් 1 m ක් පිටුපසට (*b* අවස්ථාව) ගියේ ය. *b* අවස්ථාවේදී මිනිසා සහ ඔහුගේ ප්‍රතිබිම්බය අතර දුර කොපමණ ද?




    (1) 3 m
    (2) 4 m
    (3) 5 m
    (4) 6 m

39. ප්‍රකාශ තන්තුවක් තුළින් ආලෝකය ගමන් කරන්නේ ආලෝක කිරණ කුමන සංසිද්ධියකට භාජන වීම නිසා ද?
    (1) සවිධි පරාවර්තනය
    (2) විසාරී පරාවර්තනය
    (3) පූර්ණ අභ්‍යන්තර පරාවර්තනය
    (4) වර්තනය

40. ගෘහ විද්‍යුත් පරිපථ හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?
    (1) ශේෂ ධාරා පරිපථ බිඳනය සහ සිඟිති පරිපථ බිඳින අඩංගු කට්ටලය පාරිභෝගික ඒකකය ලෙස හැඳින්වේ.
    (2) උදාසීන රැහැන පරිපථ කිහිපයකට බෙදෙන්නේ සිඟිති පරිපථ බිඳින හරහා ය.
    (3) සිඟිති පරිපථ බිඳින සහිත පාරිභෝගික ඒකකය තුළට භූගත රැහැන සම්බන්ධ නො වේ.
    (4) කෙවෙනියකට සජීවී රැහැන සම්බන්ධ කරනුයේ ස්විච්චියක් හරහා ය.

* *



Department of Examinations Sri Lanka

0437

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**11 | S | I, II**

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 - (i) | |
| 1 - (ii) | |
| 1 - (iii) | |
| 1 - (iv) | |
| එකතුව | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

# 2568 – පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය – 2024 (2025)

## (11) සාමාන්‍ය විද්‍යාව – I, II

## සාමාන්‍ය විද්‍යාව – II පත්‍රය

විභාග අංකය

..................................

..................................

නිරීක්ෂකගේ අත්සන

※ **A** කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද **B** කොටසේ ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.
※ **A** කොටස සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම සපයා **B** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා බාරදෙන්න.

### A කොටස

**1.** (i) (අ) පහත දැක්වෙන්නේ කාබන් චක්‍රයෙහි කොටසකි.




I. මෙහි *A* ලෙස දක්වා ඇති ක්‍රියාවලිය කුමක් ද? *(ලකුණු 01 යි)*

.............................................................................................................................

II. මෙහි *B* ලෙස දක්වා ඇති ක්‍රියාවලිය කුමක් ද? *(ලකුණු 01 යි)*

.............................................................................................................................

III. ශාකවල සහ සතුන්ගේ මළ දේහ ෆොසිලභවනය වීම නිසා සෑදෙන ෆොසිල ඉන්ධන වර්ග දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(1) ......................................................................................................................

(2) ......................................................................................................................

IV. ජීවීන්ගේ මළ දේහ ෆොසිලභවනය වන ශීඝ්‍රතාවට වඩා ෆොසිල ඉන්ධන දහනය කෙරෙන ශීඝ්‍රතාව වැඩි ය. මේ නිසා ඇති විය හැකි අහිතකර පාරිසරික තත්ත්වයක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

.............................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ආ) පෘෂ්ඨවංශී සත්ත්වයන් ප්‍රධාන කාණ්ඩ පහකට බෙදා ඇත. මොවුන් අතරින් මැමේලියාවන් බාහිරින් හඳුනාගත හැකි ව්‍යුහමය ලක්ෂණ දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(I) ..........................................................................................................

(II) ..........................................................................................................

(ඉ) ඒකබීජපත්‍රී ශාකවල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(I) ..........................................................................................................

(II) ..........................................................................................................

(ii) පහත දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර පොකුණක් වටා ශිෂ්‍යයකු ගමන් කළ ආකාරයයි.




(අ) ශිෂ්‍යයා ගමන් කළ මුළු දුර කොපමණ ද? *(ලකුණු 02 යි)*

..........................................................................................................

(ආ) ඔහුගේ විස්ථාපනයෙහි විශාලත්වය සහ දිශාව සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(I) විශාලත්වය :..........................................................................................

(II) දිශාව :..........................................................................................

(ඉ) මුළු දුර ගමන් කිරීමට ශිෂ්‍යයාට තත්පර 40ක් ගත වූයේ නම් ඔහුගේ මධ්‍යක වේගය ගණනය කරන්න. (පිළිතුර සුළු කිරීම අවශ්‍ය නැත.) *(ලකුණු 02 යි)*

..........................................................................................................

(ඊ) ප්‍රවේගය යනු කුමක් දැයි කෙටියෙන් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

..........................................................................................................

(උ) සිරස් ව ඉහළට විසි කළ බෝලයක් යම් උපරිම උසකට නැඟ ආපසු පහළට වැටේ. බෝලයේ චලිත අවස්ථා දෙක වෙන වෙන ම සලකා එය ත්වරණයෙන් චලනය වූ අවස්ථාව සහ මන්දනයෙන් චලනය වූ අවස්ථාව ලියන්න. *(ලකුණු 02 යි)*

(I) ත්වරණයෙන් :..........................................................................................

(II) මන්දනයෙන් :..........................................................................................

(iii) (අ) සුදුසු වචන යොදා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න. *(ලකුණු 05 යි)*

පදාර්ථය සෑදී ඇති මූලික තැනුම් ඒකකය පරමාණුව යි. පරමාණුවක න්‍යෂ්ටියේ ප්‍රෝටෝන හා ........................ අන්තර්ගත වේ. ප්‍රෝටෝන ........................ ආරෝපිත වේ. පරමාණුවක අඩංගු ප්‍රෝටෝන ගණන එහි අඩංගු ........................ ගණනට සමාන වේ. යම්කිසි මූලද්‍රව්‍ය පරමාණුවක න්‍යෂ්ටියේ අඩංගු ප්‍රෝටෝන සංඛ්‍යාව එම මූලද්‍රව්‍යයේ ........................ ක්‍රමාංකය ලෙස හැඳින්වේ. පරමාණුව පිළිබඳ ග්‍රහ ආකෘතිය ඉදිරිපත් කළේ ........................ නම් විද්‍යාඥයා ය.

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ආ) යකඩ මල බැඳීමට අදාළ පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න. *(ලකුණු 05 යි)*

(I) යකඩවල රසායනික සංකේතය ලියන්න. ..........................................................

(II) යකඩ මල බැඳීම භෞතික විපර්යාසයක් ද? රසායනික විපර්යාසයක් ද? :..........................

(III) යකඩ මල බැඳීමට අත්‍යවශ්‍ය සාධක දෙක සඳහන් කරන්න.

(1) ........................ (2) ........................

(IV) යකඩ මල බැඳීම වැළැක්වීමට යොදාගත හැකි උපක්‍රමයක් සඳහන් කරන්න.

..........................................................................................................

(iv) ස්වාභාවික විපත් සහ අවදානම් තත්ත්ව අතීතයේදීට වඩා වර්තමානයේ දී වැඩි වන ප්‍රවණතාවක් දැකිය හැකි ය.

(අ) සුනාමි තත්ත්වයක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි හේතු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(I) ..........................................................................................................

(II) ..........................................................................................................

(III) ..........................................................................................................

(ආ) ගැඹුරු මුහුදේ යාත්‍රා කරන නැව්වලට සුනාමි තරංගවල බලපෑම අඩු වීමට හේතුව කුමක් ද? *(ලකුණු 02 යි)*

..........................................................................................................

(ඉ) හරිතාගාර වායු දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(I) ..........................................................................................................

(II) ..........................................................................................................

(ඊ) හරිතාගාර ආවරණය නිසා ඇති විය හැකි අහිතකර පාරිසරික තත්ත්වය කුමක් ද? *(ලකුණු 01 යි)*

..........................................................................................................

(උ) ඉහත (ඊ)හි ඔබ සඳහන් කළ පාරිසරික තත්ත්වය නිසා ඇති විය හැකි අහිතකර විපාක දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(I) ..........................................................................................................

(II) ..........................................................................................................

* *

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka